**ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය - 2021**
------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලයේ "මණ්ඩලය" 2021 දෙසැම්බර් දිනට 31 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2019 අංක 23 දරන ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනතේ 10(3) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් සුළු හා මධ්‍ය ප්‍රමාණයේ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS for SMEs) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය ප්‍රමාණයේ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS for SMEs) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- මණ්ඩලය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 සුළු හා මධ්‍ය ප්‍රමාණයේ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS for SMEs) අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සුළු හා මධ්‍ය ප්‍රමාණයේ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (SMEs සඳහා SLFRS) වගන්ති 10.15 සිට 10.18 දක්වා විධිවිධාන අනුව මණ්ඩලය විසින් අඛණ්ඩව භාවිතා කරනු ලබන රු.6,405,463 ක් වටිනා සම්පූර්ණ ක්ෂය වූ වත්කම්වල ඵලදායි ආර්ථික ආයු කාලය නැවත තක්සේරු කිරීමට සහ ඇස්තමේන්තු දෝෂය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති පරිගණක, කාර්යාල ගෘහභාණ්ඩ, කාර්යාල උපකරණ සහ කාර්යාල අලුත්වැඩියාව යටතේ වර්ගීකරණය කර ඇති වත්කම්වල ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් කිරීම සඳහා 10.15 වගන්තියට අනුව නව තොරතුරු හෝ නව වර්ධනයන්ගෙන් ප්‍රතිඵල ලැබිය යුතුය. සමාලෝචිත වර්ෂය තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් කිරීමට අවශ්‍ය නව තොරතුරු හෝ නව වර්ධනයන් සමඟ අපට මුහුණ දීමට සිදු වී නොමැත. | මණ්ඩලය සිය මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ ඉදිරිපත් කිරීම සඳහා සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය නැවත තක්සේරු කළ යුතුය. |
| (ආ) | සුළු හා මධ්‍ය ප්‍රමාණයේ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (SMEs සඳහා SLFRS) හි 20.16(ඇ) ඡේදයට අනුව | සමාලෝචිත වර්ෂය තුළ මෙම ඉඩම් බද්දට අදාළ ලියාපදිංචි බදු පිටපත අපට ලැබී නොමැති අතර, එම බදු දීමේ නීත්‍යානුකූල ලියවිල්ල වන සහතික | බදු ඉඩම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් |

| | | |
|---|---|---|
| රු.1,680,000 ක වාර්ෂික බදු කුලිය (වැට් බද්ද හැර) සමග වසර 30 ක බදු කාලය සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් (UDA) ලබාගත් භාවිතා කිරීමේ අයිතිය වත්කම් (බදු ඉඩම්) සම්බන්ධයෙන් අවිනිශ්චිත කුලිය, අලුත් කිරීම් හෝ මිලදී ගැනීමේ විකල්ප සහ වැඩිකිරීමේ වගන්ති, උප බදු සහ කල්බදු විධිවිධාන මඟින් පනවන ලද සීමා කිරීම් වැනි අවශ්‍ය හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | කළ බදු පිටපත අපට ලැබුණේ 2022 මාර්තු 21 වැනි දිනයේය. ඒ නිසා අපි ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කරන්නෙමු. | සිදුකිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වූ අතිරික්තයට එරෙහිව එකතුව රු.473,500 ක ලැබිය යුතු ශේෂයන් 3 ක් මණ්ඩලය විසින් කපා හරින ලද නමුත්, බොල් සහ අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන සැපයීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් මණ්ඩලය විසින් ආරම්භයේ සිටම ස්ථාපිත කර අනාවරණය කර නොතිබුණි. | බොහෝ කළමණාකරණ සහ මූල්‍ය කමිටු රැස්වීම්වලදී හිඟහිටීම් පිළිබඳව සාකච්ඡා කෙරිණි. ඉන්පසුව, ඉහත කරුණුවල එකඟතාවය ඇතිව, මණ්ඩලයේ සියලුම මෙහෙයුම් මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් නියෝජිත අධිකාරියට පැවරී ඇති කමිටුව විසින් මෙම ශේෂයන් කපා හරින ලදී. | හිඟ ශේෂයන් කපා හැරීම වෙනුවට බොල් සහ අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන සැපයීම සඳහා මණ්ඩලය ගිණුම්කරණ ප්‍රතිපත්තියක් ස්ථාපිත කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයට අයත් ප්‍රොජෙක්ටරයක් සහ ශීතකරණයක් මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන සහ ස්ථාවර වත්කම් ලේඛනයට ගෙන නොතිබුණි. | අදහස් දැක්වීමක් නැත | මෙම වත්කම් අහිමි වීමේ අවදානම අවම කර ගැනීම සඳහා මණ්ඩලය ඒ සියල්ල ස්ථාවර වත්කම් ලෙස තක්සේරු කළ යුතු අතර ඒවා ස්ථාවර වත්කම් ලේඛනයට සහ මූල්‍ය ප්‍රකාශන වෙත ගෙන යා යුතුය. |

## 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| කාර්යාල උපකරණ | රු. 2,247,919 | සවිස්තරාත්මක උපලේඛන | මෙම ශේෂයන් ඉතා පැරණි වන අතර, අපට විස්තර ලබා ගැනීමට හැකියාවක් නොමැති අතර, ශූන්‍ය ශේෂයක් ලබා දෙන ඉවතලන ගිණුමක් හරහා මූල්‍ය ප්‍රකාශන වලින් ඒවා ඉවත් කිරීමට යෝජනා කරමු. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් සෑම රේඛීය අයිතමයක් සඳහාම සවිස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| කාර්යාලීය ගෘහභාණ්ඩ | රු. 644,218 | - එම - | | |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2007 අංක 07 දරන සමාගම් පනතේ 319 ඡේදය | ආයතනය සංස්ථාගත කිරීමට පෙර, මණ්ඩලය 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ක්‍රියාත්මක විය. එසේ වුවද 2022 අප්‍රේල් 30 වන විටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් බදු නිෂ්කාශන සහතිකය ලබා ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් එවකට සමාගමේ ඈවර කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට මණ්ඩලය අපොහොසත් වි තිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තවමත් බදු නිෂ්කාශනය නිකුත් කර නොමැති අතර, එසේ නොමැතිව සමාගම් රෙජිස්ට්‍රාර්වරයා ඈවර කිරීම සඳහා වන අපගේ ඉල්ලුම් පත්‍රය භාර නොගනී. මෙය අපගේ පාලනයෙන් ඔබ්බට ගිය දෙයක් බැවින් අපි මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා පවා සම්බන්ධ කර ගත්තෙමු. | ඈවර කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 අංක 19 ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය. | මණ්ඩලය විසින් සිදු කරනු ලබන සියලුම ක්‍රියාකාරකම් අභ්‍යන්තර විගණනයට ලක් කළ යුතු වුවද, ආයතනය තුළ | මණ්ඩලයේ අවම මූල්‍ය ක්‍රියාකාරකම්වල ස්වභාවය සැලකිල්ලට ගනිමින්, අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීම සහ | මණ්ඩලය විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් අභ්‍යන්තර විගණනයට ලක් කළ |

| | | |
|---|---|---|
| අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා සුදුසුකම් ලත් විගණකවරයකු මණ්ඩලය විසින් පත් කර නොතිබුණි. | සුදුසුකම් ලත් විගණකවරයෙකු පත් කිරීම ලාභදායී නොවන බව කළමනාකාරීත්වය සලකයි. | යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.5,939,945 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.19,138,967 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.13,199,022 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පසුගිය ගිණුම් කාලයට සාපේක්ෂව බිල්ඩ් ශ්‍රී ලංකා ප්‍රදර්ශනයේ ආදායම අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 නොවැම්බර් 15 දින සිට වසර 09ක කාලයක් සඳහා කාර්යාල පරිශ්‍රයක් ලබා ගැනීම සඳහා මණ්ඩලය 2019 අගෝස්තු 02 වැනි දින සීමාසහිත පුද්ගලික සමාගමක් සමඟ බදු ගිවිසුමකට එළඹ ඇති අතර සම්පූර්ණ කාලය සඳහාම මුළු බදු කුලිය රු.15,000,000 ක මුදලක් කල්තියා ගෙවා තිබුණි. මේ අතර, වසර දෙකක් ඇතුළත මණ්ඩලය සඳහා ලේකම් කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා මණ්ඩලය 2021 දෙසැම්බර් 29 දින නාගරික සංවර්ධන අධිකාරිය (UDA) සමඟ පර්චස් 30 ක ඉඩමක් වසර 30 ක කාලයක් සඳහා රු.1,680,000 ක වාර්ෂික බදු කුලිය සමඟ ලබා ගැනීම සඳහා තවත් බදු ගිවිසුමකට එළඹ තිබුණි.<br>2019 අගෝස්තු 02 වැනි දින මණ්ඩලය සහ සීමාසහිත පුද්ගලික සමාගමක් අතර ඇති කරගත් බදු ගිවිසුම 2027 වසර දක්වා වලංගු වුවද, ඉහත පුද්ගලික සමාගමට 2024 සිට 2027 දක්වා කාලය සඳහා දැනටමත් ගෙවා ඇති රු.5,000,000 ක බදු කුලිය අයකර ගැනීමට කිසිදු වැඩපිළිවෙළක් නොගෙන | කල්බදු ගිවිසුම මගින් වසර 4කට පසු මාස 6ක දැනුම්දීමක් ලබාදී අවසන් කිරීමට පහසුකම් සලසා ඇති අතර බදු දීමනාකරු විසින් ප්‍රයෝජනයට නොගත් කාලසීමාව සඳහා කල්තියා ගෙවන ලද බදු කුලී ආපසු ගෙවීමට භාරගෙන ඇත. | මණ්ඩලයට අනාගත පාඩු අවම කර ගැනීම සඳහා තීරණ ගැනීමට කළමනාකාරීත්වය අවධානය යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2024 වන විට ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකර දැනට පවතින කාර්යාලය නව ගොඩනැගිල්ලට ගෙන යාමට මණ්ඩලය අදහස් කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ඉදිරියේදී මණ්ඩලයට රු.5,000,000 ක අලාභයක් සිදුවීමට ඇති ඉඩකඩ විගණනයේදී බැහැර කළ නොහැක.<br>තවද, නාගරික සංවර්ධන අධිකාරිය UDA සමඟ ඇති කරගත් බදු ගිවිසුමේ 1.9 වගන්තියේ සඳහන් නියමිත කාල සීමාව තුළ නව ලේකම් කාර්යාල ගොඩනැගිල්ලක් සංවර්ධනය කිරීම සඳහා අරමුදලක් ස්ථාපිත කර නොතිබුණි. | | |
| (ආ) | මණ්ඩලයේ මාසික ඉදිකිරීම් ප්‍රවෘත්ති ප්‍රකාශනය මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීම සඳහා සේවා ලබා ගැනීම සඳහා 2015 මාර්තු 06 වැනි දින සීමාසහිත ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (ANCL) සමඟ වසර පහක කාලයක් සඳහා මණ්ඩලය අවබෝධතා ගිවිසුමකට (MOU) එළඹ ඇති අතර මෙම ගිවිසුම 2020 මාර්තු 06 දින අවසන් වී ඇත. කෙසේ වෙතත්, අවබෝධතා ගිවිසුම අවසන් වීමෙන් පසු ANCL විසින් නව ගාස්තු පනවනු ලැබුවද, මෙම අවබෝධතා ගිවිසුම දීර්ඝ කිරීමට හෝ යාවත්කාලීන කිරීමට මණ්ඩලය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අපි දැන් සාකච්ඡා කරමින් නව අවබෝධතා ගිවිසුමක් (MOU) අත්සන් කිරීමට කටයුතු කරමින් සිටිමු. | පවතින අවබෝධතා ගිවිසුම දීර්ඝ කිරීමට හෝ යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | රු.2,442,028 ක් වටිනා ගිණුම් අයිතම තුනක් (03) 2022 මැයි 31 දිනට පවා එම ගිණුම් නිෂ්කාශනය කිරීමට පියවර නොගෙන වෙනත් ගෙවිය යුතු සහ ලැබිය යුතු මුදල් යටතේ වසර 03 කට වැඩි කාලයක් මූල්‍ය ප්‍රකාශන වෙත අඛණ්ඩව ගෙනවිත් තිබුණි. | රු.229,792ක ලැබිය යුතු රඳවා ගැනීමේ බද්ද ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව විසින් අප වෙත ගෙවන ලද පොලී මත කරන ලද අඩු කිරීම් සම්බන්ධ වන අතර වසර 3ක් ඇතුළත හිමිකම් පෑමට හැකි වන අතර අපි ලබන වසරේ එය හිමිකම් කියන්නෙමු.<br>ආදායම් බදු ලැබිය යුතු රු.1,865,865 සහ වැට් බදු ගෙවිය යුතු හර රු.346,371 - දේශීය | ඵලදායී ක්‍රියාමාර්ග ගනිමින් මෙම ගිණුම් නිෂ්කාශනය කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ආදායම් දෙපාර්තමේන්තුව අපගේ වාර්තා අවසන් කර නොමැති අතර 2017/2018 ට අදාළ ආදායම් බදු සම්බන්ධයෙන් ඔවුන් තවමත් ප්‍රශ්න කරමින් සිටී. | |
| (ඈ) | මණ්ඩලයේ සුමට හා ඵලදායි පරිපාලනය සඳහා මානව සම්පත් සහ මූල්‍ය සම්පත් කළමනාකරණයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් නීති රීති සපයන ක්‍රියා පටිපාටි අත්පොතක් සහ මූල්‍ය අත්පොතක් නොතිබුණි. | අපි ක්‍රියා පටිපාටි අත්පොතක් සම්පාදනය කිරීම ආරම්භ කර ඇත්තෙමු. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ක්‍රියා පටිපාටි අත්පොතක් සහ මූල්‍ය අත්පොතක් හඳුන්වා දීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2021 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවලට අනුව, වාණිජ මණ්ඩලය විසින් ගෙවිය යුතු ආදායම් බද්ද රු.2,304,743 ක් වූ අතර එයින් රු.2,097,275 ක් වසර දෙකකට වැඩි කාලයක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2017 තරම් ඈත කාලයකදී පවා බදු වාර්තා අවසන් කර නොමැති නිසා අපට ලැබිය යුතු සම්පූර්ණ ආපසු ගෙවීමෙන් ඉල්ලා සිටින රු.1,096,789 එම මුදල ඉහත අදාළ ගිණුමට මාරු කර නොමැත. | බදු වාර්තා අවසන් කිරීමට සහ නොගෙවූ බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රමාදයකින් තොරව ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දේපළ, පිරියත සහ උපකරණ (PPE) යටතේ පෙන්වා ඇති රු.1,691,092 ක් වූ කාර්යාල අලුත්වැඩියා කිරීමේ පිරිවැය මණ්ඩලයේ ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | වසර 3 කට පෙර අප විසින් අවසන් කරන ලද අපගේ කලින් කුලී ස්ථානයට අදාළ රු.1,961,092 ක කාර්යාල අලුත්වැඩියාව දැන් මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කළ යුතුය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සෑම වත්කමකම විස්තර ස්ථාවර වත්කම් ලේඛනයට ද ඇතුළත් කළ යුතුය. |
| (උ) | 2021 දෙසැම්බර් 31 දිනට රු.7,993,623 ක් වටිනා ස්ථාවර වත්කම් මණ්ඩලය නිසි ලෙස කේතනය කර නොතිබුණි. මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති දේපල, පිරියත සහ උපකරණවල වටිනාකම නිවැරදිව හඳුනා ගැනීමට සහ ඒ අනුව වාර්ෂික වත්කම් සත්‍යාපනය කිරීමට හැකි වන පරිදි එම කේතයන් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | කළමනාකාරිත්වය විසින් සමීක්ෂණ මණ්ඩලයක් පිහිටුවා ඇති අතර මෙම අතපසුවීම් ඉදිරි වර්ෂයේදී නිවැරදි කරනු ඇත. | ස්ථාවර වත්කම් නිවැරදිව හඳුනා ගැනීම සඳහා ඒවා නිසි ලෙස කේතගත කළ යුතුය. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| යෙදවිය යුතු සේවක සංඛ්‍යාව තීරණය කිරීම සහ එම සේවකයන්ගේ සේවය පත් කිරීම, සේවයෙන් පහ කිරීම හෝ සේවයෙන් පහ කිරීම සහ ඔවුන් සම්බන්ධයෙන් විනය පාලනයක් ක්‍රියාත්මක කිරීම සහ ඔවුන්ට එම වැටුප්, දීමනා සහ පාරිතෝෂික ලබා දීම මණ්ඩලයේ වගකීමක් වුවද මණ්ඩලයේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා දක්ෂ හා ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම සඳහා අනුමත කාර්ය මණ්ඩලයක් හෝ බඳවා ගැනීමේ සහ උසස්වීම් යෝජනා ක්‍රමයක් නොමැත. එහි ප්‍රතිඵලයක් ලෙස සියලුම නිලධාරීන් සහ සේවකයන් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති අතර ඉන් නිලධාරීන් 09 දෙනෙකු 2021 දෙසැම්බර් 31 දිනට වසර 05 සිට 16 දක්වා කාලසීමාවක් සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදී සිටිති. | 2001 වර්ෂය ආරම්භයේ සිටම මණ්ඩලයට අනුමත කාර්ය මණ්ඩලයක් නොතිබුණි. කළමනාකරණ කමිටුවේ සහ කළමනාකරණ මණ්ඩලයේ සාකච්ඡා කිරීමෙන් පසු අවශ්‍යතා පදනම මත සියලුම බඳවා ගැනීම් සිදු කරන ලදී. ප්‍රතිපත්තියට අනුව සියලුම කාර්ය මණ්ඩලය කොන්ත්‍රාත් පදනම මත සිටීමයි. | ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලයේ 2019 අංක 23 දරන සංස්ථාපිත පනතේ 6(උ) වගන්තියට අනුව මණ්ඩලයේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා දක්ෂ හා ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම සඳහා අනුමත සේවක සංඛ්‍යාවක් හෝ බඳවා ගැනීමේ හා උසස්වීම් යෝජනා ක්‍රමයක් මණ්ඩලය සතුව තිබිය යුතුය. |